

## මැතිවරණය
**ප්‍රේමවංශ දසනායක**

නිල් රතු කොළ පාට පාට
පිහාටු ඇඳි කලු කපුටෝ
රංචු පිටින් හතර වටින්
කෑමොර දෙති උඩ අහසේ

ඉරට යටින් හඳට යටින්
උන් සෙවනැලි බිම ඇඳිලා
පාට අකා මකා වෙලා
අනන්‍යතාවය මැකිලා

නිමක් නොමැති උන් කලහය
ඉවසනු බැරි හිරු දෙවියෝ
සැඬ හිරු රැස් පොකුරු හලා
දවති පොළොව ගිනි අව්වේ

ගහ කොළ මල් මිලින වෙලා
සිත් කෙත් වතු පුරන් වෙලා
බලාපොරොත්තුව සුනු වී
ඉගිලී යයි බොල් සුළඟේ

ඉඩෝරයට වැසි ගෙනෙනා
වැහිලිහිණිය එයි සිතනා
දෙනෝදහක් උගතමනා
බලා සිටිති දෑස අයා

උන් හැම දෙන තුටු කරන්න
හැකිලුන නෙත විවර වන්න
වියලුන හද තෙත් කරන්න
බලාපොරොත්තුව වහින්න

හතර වටින් කලුවර කොට
විදුලි කොටා අකුණු සැරට
ගගනතලය දෙදරුම් කොට
අසනි වැස්ස ඇද හැලෙන්න

පුහුදුන් මිනිසුන් පව් කඳ
කිසිත් නොහැර සෝදා හැර
සකල දෙරණ පිරිසිදු කොට
අලුත් ලොවක් තනා දෙන්න

## මට ඉන්නේ නුඹ විතරද
**චානක ඉලංගගේ**

දහසක් කඳුළු සයුරේ රළ අතර තුර
සගවා තබා ආවෙමි නුබ දැක ගන්න
දිවි ගිමි නිවන මීවිත උගුරක සුවය
නොබලා කෙසේ හෙට මම ආපසු යම්ද
...
සීතල මී බින්දු දෙතොලග පිපිරෙන්නේ
සතියක විඩා සිත එක මොහොතට ඉගිලෙන්නේ
ගීයක පද වැලක් මට නොදැනීම කියවෙන්නේ
මා ආ ගමනේ සුන්දර තැන් සිහිවෙන්නේ

බත් පත නිවී සීතල වෙනවා නේද
හෙට උදයේ වැඩට යන්නත් ඕනා නේද
තර වටුවකට වැඩියෙන් ඒ ලෙන්ගතු කම නේද
වෙරි හිඳුනම මට ඉන්නේ නුඹ විතරක් නේද



## සංගා
**ජගත් වෙත්තසිංහ**

ජය සතුට ගංගා
සැම සිත් තුළට නැංගා
ජය දදය නංගා
ලොවම ජයගත් නමයි සංගා

ලක් බිමෙහි වීරය
පිති හරඹයෙහි සූරය
පිදෙන උපහාරය
ඔබට කැන්ගරු දෙසෙහි වාරය

ලක් පිළෙහි නායක
මහ මෙහෙවරක දායක
ඔබගෙ නම මේලක
ගැයෙන රසපද වැලකි ගීයක

හුරු පුරුදු ශතකය
ගෙනදුන් මිහිර මතකය
සතුට සැම සිතකය
අපේ ජාතික කොඩිය අතකය

සුපිරි තරු ගොමුවේ
ඩොන් බ්‍රැඩ්මන්ට සම වේ
සමු ගැනුම හමුවේ
රටක් පොබ කර ඉණිම් නිමවේ

## අම්මා බලන්න ගියෙමි
**ජනිත් විතාරණගේ**

නිකන් දවසට වැඩිය කලියෙන් පෝය දවසට ඇහැරිලා
වැවේ අයිනේ නෙලුම් මානෙල් පිපෙන හරියට ගාටලා
ගෝනියක් සුදු මල් කඩාගෙන හොඳම මල් ටික තෝරලා
ගිහින් පන්සල පේන හරියට බලා උන්නා නැවතිලා

රෑට සුදු රෙදි කෑලි ඉර ඉර උදේ වෙනකන් ඇහැරලා
නිවී යන පොඩි පහන් දැල්ලෙන් පහන් තිර කොට අඹරලා
කාලේ පොල්තෙල් කුප්පි ටිකකුත් දාලා මල්ලක් පුරවලා
අරන් යනවා වෙවුල වෙවුලා හිතේ හයියෙන් ඇවිදලා

පහල ලිඳ ළඟ ගහේ කොස් ගෙඩි පැහුණ හැටියේම බරවෙලා
කපුටො කනකන් බලන් හිටියට ගහක් නිහඬව ඉවසලා
අක්කා ගෙදරින් පැනලා ගිය දා අඬලා දොඩලා වැලපිලා
බඩක් එක්කලා ආයේ ආවාම එදත් ඇඩුවා හැංගිලා

කිසිම දවසක නොලෑ මිරිවැඩි ගොඩක් අද්දර නැවතිලා
බලා ගත්තට ලැබුන රුපියල් පඩුරු එක දෙක හංගලා
දුන්න අයියම කොටහා උදුරන් ගියත් රවලා ඔරවලා
ගෙදර ආවාම පුතේ කාලාද ඇහුවේ වාගේ බුදුවෙලා

හීනි ගල් කැට කකුලේ ඇනුනම රිදෙන්නට ඇති මහ ගොඩක්
වාරු නැති අඩි තියලා යනකොට දැනෙන්නට ඇති තනිකමක්
පෝය දවසට සිල් නොගත්තත් කඩාගෙන මහ මල් ගොඩක්
පහක් විස්සට දීපු පිනටම තවුතිසාවේ ඇති ඉඩක්

පුරුදු ලණු ඇඳ නැතිව මහ රෑ ඉන්නවා ඇති ඇහැරිලා
කඳුරු ගෙඩි කන වවුල් සද්දෙට බලනවා ඇති ගැස්සිලා
ආයේ එනකොට ඉරුණ බණ පොත අරන් එන්නම් අලවලා
පාලු යන්නට සොහොනෙ අයිනක තියලා යන්නම් හංගලා

boondi.lk

## නිළියකගේ භූමිකාව
**අරුණ ක්‍රිෂාන්ත හල්ලල**

වත්සුණු තැවරුණු ඔය මුව දුටු නිති
ගැස්සුනු හදවත් කොතෙකුත් දැක ඇති
නැටුමට රිසි ඇති කෝල හැගුම් ඇති
ඇරයුම් නිති ඇති මිනිසුන් බොහො වෙති
ඇරයුම නුඹටයි
මේ රග මඩලට
රැගුමන් දැක ඇති
නුඹෙ ළය දැක නැති
මිනිසුන් වෙනුවෙන්
හැකිනම් රගනට සැබෑ චරිතයක් ලෙස
නුඹෙ නම කියවෙයි හොදම නිළිය ලෙස

# ගුරුගීතය




**චූලක බණ්ඩාරවත්ත**

චින්ගීස් ආයිත්මාතෙව් (Chinghiz Aitmatov - චිංගීස් අයිට්මාටොෆ්) ගේ ගුරු ගීතය හෙවත් පළමු ගුරු තුමා කෘතියෙහි ඈත එපිට කිර්ගීසියාවේ මුල්ලාවරුන්ගේ ආධිපත්‍යට යටත්ව සිටි ජනතාවකගේ දරුවන් උදෙසා තමන් විසින්ම ඉතා ආයාසයෙන් පාසලක් අරඹා , ගෙන් ගෙට ගොස ළමුන් සොයා තමන් දන්නා දේ ඉගැන්වූ අප්‍රතිහත ධෛර්යෙන් යුත් විප්ලවවාදී චරිතයක් ගැන කියවෙයි. ඔහු ගෙන් අකුරු උගැනු අල්තිනායි නම් දැරියක් නගරයට යවා අනතුරුව සමාජවාදී නිදහස් අධ්‍යාපනයෙන් ඇය මහාචාර්යවරියක් බවට පත් කරයි.



සෝවියට් සමාජවාදී ජනරජය බිහි නොවන්නට , දුයිෂෙන් වැනි අයෝමය විප්ලවවාදීන් බිහි නොවන්නට අල්තිනායිලාට අධ්‍යාපනයේ ගිරි ශිඛර තරණය කිරීම සිහිනයක් පමණක් වනු ඇත. අල්තිනායිගේ පරම්පරාව වැඩිහිටියන් වන විට දුයිෂෙන් මහලු වයසේය. ඒ වන විට සෝවියට් අධ්‍යාපනය කිර්ගිස්තානය වැනි අතිශය පිටිසර බද ගම්මාන වලටද පැතිර තිබුනේය.

සාර් ගේ වැඩවසම් පාලනය තුල හරකා බාන , වතු පිටි වලට පමණක් කොටුකර තිබු ජනජීවිතය , රුසියානු විප්ලවයෙන් පසුව උඩු යටිකුරු වී තිබුනි. සමාජයේ සෑම ප්‍රතිලාභයන්ම සමසේ බෙදී යමින් තිබුණි. විප්ලවය යනු එයයි.

අල්තිනායි මහාචාර්යවරියක් ලෙස ආරාධිත අමුත්තිය ලෙස පැමිණ පාසල විවෘත කරන අවස්ථාවේදී මහලු දුයිෂෙන් ලියුම් බෙදන්නේය. චින්ගීෂ් ආයිත්මාතෙව් මෙම කෘතිය තුලින් පසු කලෙක ඉස්මතු වූ සෝවියට් නිලධාරී වාදයද වඩා මිත්‍රශීලී විවේචනයක නියැලේ. නැගී එන සමාජයේ පිළිගත් යයි සැලකෙන පදවි තානාන්තර වලට මුල්තැන ලැබෙන විට, එම සමාජය ගොඩනැගු මිනිසුන් බොහෝ දුරක සිටින බව ගුරුගීතය තුළින් මතු කර ඇත.

අල්තිනායි පාසැල විවෘත කරන මොහොතේ දුයිෂෙන් තම විප්ලවයේ අවසන් කර්තව්‍යය ඉටු කරමින් අව්‍යාජ රාජ්‍ය සේවකයෙකු ලෙස ලියුම් බෙදන්නේය.- ඔහු ගොඩනැගු පාසල නවීකරණය කිරීමෙන් පසුව ඔහුට එම උත්සවයට හෝ ආරාධනා නොකිරීම පිළිබඳව කිසි විටක දුයිෂෙන් පසුතැවිලි නොවීය. ඒආණ් සිදුවීම් තුලින් විප්ලවය විසින් ගොඩනගන සැබෑ මිනිසුන්ගේ චිත්ත ධෛර්ය කිසි විටෙක නොසිඤෙන බව දුයිෂෙන් තුලින් අපි දකිමු.

දේශප්‍රේමී යුධ සමයේ රතු භටයෙකු ලෙසද, පස්චාත් යුධ සමයේ සමාජයට මග පෙන්වන ගුරුවරයෙකු ලෙසද, නිහතමානී රාජ්‍ය සේවකයෙකු ලෙසද සමාජවාදයේ ජයග්‍රහණය උදෙසා තම දිවිය කැප කරයි. ඔහු තම පෞද්ගලිකත්වයට වඩා සමාජවාදය ප්‍රමුඛ බව ප්‍රයෝගිකත්වයෙන් ලොවට පෙන්වූ උදාර විප්ලවවාදියෙකි. එය සෝවියට් සමාජවාදී සමාජයට අවශ්‍ය වූ ආදර්ශයයි. මනුෂ්‍යත්වය , ප්‍රේමය, අව්‍යාජ ගැමිකම, දරිද්‍රතාව සමස්ත කතාංගය පුරාම දිවයයි.

ගුරු ගීතය ජීවිතයේ එක් වරක් හෝ කිවයුතු පොතක් ලෙස මම සිතමි .